කෑගල්ල අධ්‍යාපන කලාපය

Kegalle Education Zone

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය** — 11 ශ්‍රේණිය

Practice Paper — Grade 11

**නර්තනය I**

**Dancing I**

**පැය එකයි**

***one hours***

**I කොටස**

- **සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න**

1. උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹවලට සමානව පහතරට සම්ප්‍රදායේ අභ්‍යාස කරන පද හඳුන්වන නාමය වන්නේ.
   i. මණ්ඩි පද ii. ඉලංගම් සරඹ iii. පා සරඹ iv. සරඹ පද
2. දෙසුළු මහා තුන්තිතට අයත් තාල රූපය මාත්‍රා ............ වේ.
   i. 2+2+4 ii.2+2+3 iii.2+3+4 iv.2+4+2
3. ශ්‍රී ලංකාවේ අප්‍රචලිත ගැමි නාටක දෙකක් වන්නේ,
   i.සොකරි, කෝලම් ii. කෝලම්, නාඩගම් iii. රූකඩ, සොකරි iv.රූකඩ, නාඩගම්
4. රන්විලි දෙකොනට සොඳින් තබන්නේ මෙම කවි පදය අයත් වන්නේ ..................... නැටුමටයි.
   i. ගොයම් ii. ලී කෙලි iii. තාලම් iv. මෝල්ගස්
5. තාල තැබීමේ දී තාල ස්ථාන දැක්විම ...... නම් වේ.
   i. අනාඝාත ii. අඝාත iii. ආතත iv. විතත
6. බෙර පද කවි පද ආදියට අදාල තාල ලියා දැක්වීම
   i. ප්‍රශ්නකරණයයි ii.වර්තාකරණයයි iii. ප්‍රස්ථාරකරණයයි iv. ප්‍රකාශකරණයයි
7. ග්‍රහ පංති හා ඇඹුම් කවි අයත් වන ශාන්ති කර්මය වන්නේ
   i. සන්නි යකුම ii. රට යකුම iii. දෙවොල් මඩුව iv. බලි
8. මේරුං විරාජිත සමං .......... යනුවෙන් ගැයෙන්නේ,
   i.නමස්කාර ගායනා ii. ප්‍රශස්ථි ගායනා iii. සී පද ගායනා iv. ටීකා ගායනා
9. කතකලි නර්තනයේ දි හාසෝත්පාදක ගනයට අයත් චරිත සඳහා ................ වේෂ නිරූපණ ක්‍රමය භාවිතා කරයි.
   i. මිනික්කු ii.පච්චා iii.කත්ති iv.කාරි
10. මාත්‍රා කැටි කර දැක්වීම, මාත්‍රාවක් ඇදීම හා මාත්‍රාවක් අත හැරීම මෙම සංකේත මගින් දැක්වේ.
    i. ◡ ,_ ,+
    ii. _ ,◡ ,+
    Iii .◡ ^, _
    iii. + ,◡ ,_
11. කවිකාර මඩුවේ ප්‍රශස්ථි ගායනා කරනු ලැබුයේ
    i. නිලමේවරු ii.රාජ පුරෝහිතයින් iii.රාජමහාමාත්‍යවරුන් iv.වන්දිබට්ටයින්
12. බලි ශාන්ති කර්මවලදී භාවිතා නොකරන කවි විශේෂයකි
    i. අට මංගල කවි ii.කඩතුරා කවි iii.ඇඹුම් කවි iv.ග්‍රහ පංති කවි

13. පහතරට සිංදු වන්නම් රචනා වූයේ

i. කෝට්ටේ හා කුරුණෑගල යුගයේදීය ii.දඹදෙනි හා කුරුණෑගල යුගයේදීය

iii.කෝට්ටේ හා යාපහුව යුගයේදීය iv.දඹදෙනි හා කෝට්ටේ යුගයේදීය

14. කෝලම් රඟ මඩලේ දක්නට ලැබෙන සුවිශේෂී සැරසිල්ලකි.

i. යහන ii.මල් බුලත් තට්ටුව iii.ආරුක්කුව iv.වෙස් අත්ත

15. මං වගේ පේඩි කතක් මනා ........... යන කවියෙන් කියැවෙන්නේ

i. නොංචි පිළිබඳවය ii.ලෙංචිනා පිළිබඳවය iii.සොකරි පිළිබඳවය iv.පුරන්සිනා පිළිබඳවය

16. භාරතීය සම්භාව්‍ය නර්තන කලාව නැමැති ග්‍රන්ථය

i. මාහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ කෘතියකි

ii.මාහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතාගේ කෘතියකි

iii.මාහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ කෘතියකි

iv.මාහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මියගේ කෘතියකි

17. 2005 වර්ෂයේදී අධ්‍යාපනික වශයෙන් සිදු වූ වැදගත් සිදුවීමකි.

i. ශ්‍රී පාලි මණ්ඩපය ආරම්භ වීම ii.සෞන්දර්ය අධ්‍යපන ආයතනය ආරම්භ වීම

iii.සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය ආරම්භ වීම iv.ජාතික අධ්‍යාපන ආයතනය ආරම්භවීම.

18. රාධා ක්‍රිෂ්ණා ප්‍රේම වෘතාන්තය තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති මණිපුරි නර්තනයකි.

i. පුංචෝලම් ii.රාස්ලීලා iii.භංගි පරේන්ග් iv.භාවලීලා

19. කච්ච කෙට්ට නම් අභ්‍යාස පුහුණුව ලබා දෙන නර්තන සම්ප්‍රදාය වන්නේ

i. මිණිපුරිය ii. කථක්ය iii. කථකලිය iv.භරතය

20. කොහොඹා හැල්ල, මුදුන් තාලය, දෙවොල් පද යන නර්තන දක්නට ලැබෙන්නේ පිළිවෙලින්

i. කොහොඹ කංකාරිය,කිරිමඩුව, හැල්ලුම් මඩුව ii.කොහොඹ කංකාරිය, කිරිමඩුව, ගී මඩුව

iii.කොහොඹ කංකාරිය, පහන්මඩුව, පූනා මඩුව iv.කොහොඹ කංකාරිය, පහන්මඩුව, දෙවොල් මඩුව

- 21 සිට 23 දක්වා ප්‍රශ්න වලට පහත වගුව භාවිතා කරන්න.

| පේළිය | A තීරය | B තීරය | C තීරය |
|---|---|---|---|
| 1 | ඉල්ලම් | අස්නේ | ඉල්ලම් මුදු |
| 2 | තෙල්මේ | කොහොඹා කංකාරිය | පුහුල |
| 3 | බලිශාන්ති කර්මය | මුදුන් තාලය | දෙවොල් මඩුව |

21. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්ති කර්මය සඳහන් වන්නේ

i. 1 පේළියේ A තීරුවේය ii.2 පේළියේ B තීරුවේ

iii.3 පේළියේ C තීරුවේ iv.3 පේළියේ A තීරුවේ

22. දවුලේ දක්නට ඇති සුවිශේෂී කොටස් ඇතුලත් වන්නේ

i. 1 පේළියේA හා C තීරුවලය ii. 2 පේළියේ A හා B තීරුවලය

iii.2 පේළියේB හා C තීරුවලය iv.3 පේළියේ A හා C තීරුවලය

23. සබරගමු නර්තන අංගයක් ඇතුලත් වන්නේ

i. 1 පේළියේ A තීරුවේය ii.2 පේළියේ B තීරුවේය

iii. 1 පේළියේC තීරුවේය iv.3 පේළියේ B තීරුවේය

24. විහාර දේවාලවල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණි කලගෙඩි සෙල්ලමේ යෙදෙන නලගනෝ වෙති මෙම සටහන කරන ලද්දේ

i. ඉබන් බතූතාය ii.පාහියන් භික්ෂුව ය iii.රොබට් නොක්ස් ය iv.ස්පිල් බර්ජන් ය

25. සැළලිහිණිය, තිත්ත බත, පරෙවිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ

i. ඒ ඉඹුල්ගොඩ මහතාය	ii.නිමල් වෙල්ගම මහතාය

iii.වසන්ත කුමාර මහතාය	iv.ප්‍රේමකුමාර එපිටවෙල මහතාය

26. බෙන්තර ගලපාත විහාරයේ ඇති මෙම රූපය කැටයම් කර ඇත්තේ

I. අනුරාධපුර යුගයේදීය	ii. ගම්පළ යුගයේදීය

iii. දඹදෙණි යුගයේදිය	iv. කෝට්ටේ යුගයේදීය



27. A හා B රූපවලින් දැක්වෙන්නේ



A



B

i. වඩිග පටුන සහ දෙවොල්ය	ii.වඩිග පටුන සහ ලිව්ජවීය

iii.ලිච්ජවී සහ දෙවොල්ය	iv.වඩිග පටුන සහ තෙල්මේය

28. මෙලෙයි යකුන් හා රුප්පා යකුන් පුදනු ලබන්නේ

i. උඩරට සම්ප්‍රදායේය	ii.පහතරට සම්ප්‍රදායේය

iii.සබරගමු සම්ප්‍රදායේය	iv.සම්ප්‍රදායන් තුනේමය

29. මාත්‍රා 2+ 3 තාල රූපයට අයත් වට්ටම් වන්නේ

i. කුද කුජිගත ii.දොං ජිංත ගත දොංත iii.දොං දොංජිංගත iv.කුදංත ගත දොං

30. තාකු තක්කුං තරිකිට ..................... තත් ජෙං තජෙං ............ හිසි තැනට සුදුසු පද කොටස් වන්නේ.

i. තකුද තත් ජෙං - තත්ජෙං	ii.ජික්කුං තරිකිට - ජිකුද තත් ජෙං

iii.තාකු කක්තුං තරිකිට - ජෙං තා iv.ජෙංතා ජෙතා ජෙත කුද ජෙං ත තා

## 11 කොටස (උඩරට නැටුම්)

31. දොළොස්වන ගොඩ සරඹය හඳුන්වන සරඹ නාමය වන්නේ
    i. ඇල සරඹය ii.චන්ද්‍රිකා සරඹය iii.බඹර සරඹය iv.දෑත පෑගීමේ සරඹය
32. දොම් තකු, දෙම්තකු, දොම් ජිං - ගත් තක් ජිං තරිකිට මෙම බෙර පදය අයත් තාල රූපය ලෙස දැක්විය හැක්කේ
    i. මාත්‍රා 2+3+3 තාලය ii.මාත්‍රා 3+3+4 තාලය iii.මාත්‍රා 2+2+3 තාලය iv.මාත්‍රා 2+2+4 තාලය
33. සැව්ලා වන්නමට අයත් බෙර පදය වන්නේ
    i. දොං ජිංත ගත දොංත ii.දොං ජිං ජිං ගජිගත iii.දොං ජිජිගත iv.දොද් දොං ජිං ජිං ගජිගත
34. "හිරුත් අවර ගිරත් පැමිණී - කලක් වසන තැනින් දුවන" ............කවියේ ඉතිරි පද කොටස වන්නේ.......
    i. පැන අඩි පත්‍රසි බුදිමින් ii.නැත නාඩි ඉද වාඩි වෙව්ලුම්
    iii.උනු දැඩි වනවාඩි ලන්නම් iv.කර දැඩි මුසලඩි වන්නම්
35. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ එන ගුරුගේ මාලාව, යක්කම් පහ, සහ ගබඩා කොල්ලය යන අංග අයත් වන්නේ
    i. ගායනය සහිත නර්තන අංගයන්ටය ii. ගායනය රහිත නර්තන අංගයන්ටය
    iii.නාට්‍යමය අවස්ථාවන්ට ය iv.පුජාර්ථය දැක්වෙන අවස්ථාවන්ටය
36. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටල ලෙස දැක්විය හැක්කේ
    i. පබළු ,දෙවොල් ,මල් පද කට්ටලය ii.වෙස්, පබළු ,දෙවොල්
    iii.තෙල්මේ, දෙවොල්, පත්තිනි iv.වෙස්, උඩැක්කි , පන්තේරු
37. දොදොංත තකුදොං යන බෙර පදය භාවිතා කරන වන්නම ලෙස දැකවිය හැක්කේ
    i. තුරඟා වන්නම ii.වෛරෝඩි වන්නම iii.සැව්ලා වන්නම iv.සිංහරාජ වන්නම
38. දොං ජිංත ගත දොංත වට්ටමේ දෙවෙනි අඩව්වට අයත් පද කොටසකි
    i. තත් තකට තක රොං............................
    ii.තාන් දොමිති ගත දොම්කිට.............................
    iii.තාම් ජිං තත් තත් ජිං තත් ජිංතත් තත්.......................
    iv.තත්තොහ තක තොහ..............................
39. මෑත කාලයේ දී දේශීය ගැමි නැටුම් අතරට එක් වූ මෝල්ගස් නැටුම නිර්මාණය කල ශිල්පිනිය වන්නේ
    i. මිරන්ඩා හේමලතා මහත්මිය ii.වජිරා චිත්‍රසේන මහත්මිය
    iii.චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය iv.අංජලිකා චිත්‍රසේන මහත්මිය
40. සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් උඩරට නර්තනය ඉගැන් වූ ප්‍රවීණ ශිල්පියෙකි
    i. කේ එස් ප්‍රනාන්දු මහතා ii.අර්නොලිස් ඉඹුල්ගොඩ මහතා
    iii.කුලසිරි බුදුවත්ත මහතා iv.ප්‍රේමකුමාර එපිටවෙල මයා

කෑගල්ල අධ්‍යාපන කලාපය

Kegalle Education Zone

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය** 11 ශ්‍රේණිය

Practice Paper Grade 11

**නර්තනය I I**

**Dancing I I**

**පැය එකයි**

***one hours***

**11 කොටස**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.**

01) 1 ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ වන්නම් රචනා වී ඇත්තේ ........................................................ මඩුවේදීය.

2 සවරන් පටිය සහ වලයම ඇතුලත් වාද්‍ය භාණ්ඩය ..................................වේ.

3 පින්නල් කෝලාට්ටම් ද්‍රවිඩ ගැමි නර්තනය හා සමාන සිංහල ගැමි නර්තනය ............................... නමින් හැදින්වේ.

4 මහා පරාක්‍රමබාහු රජු විසින් නැටුම් , ගැයුම්, වැයුම් සඳහා ඉදිකල මණ්ඩපය ................................. .............. වේ.

5 ................................................... බලි ශාන්තිකර්මයේ දී තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස භාවිතා කෙරේ.

6 සෞන්දර්ය අධ්‍යයන ආයතනය................................. වර්ෂයේදී ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත්විය

7 සොකරි නාටකයේදි ප්‍රධාන වාද්‍ය භාණ්ඩවලට අමතරව භාවිතා කරනු ලබන සුසිර වාද්‍ය භාණ්ඩය ........................................ වේ.

8 ........................................ මහත්මිය විසින් කුඹ කථා මුද්‍රා නාට්‍යයේ රංග රචනය නිර්මාණය කරන ලදී.

9 තාන්ජෝර් සහෝදරයින්ගේ දායකත්වයෙන් ප්‍රවර්ධනය වූ නර්තන සම්ප්‍රදාය ...... ........................................................ නම් වේ.

10 සෙමෙන් පියවර කීපයක් ඉදිරියට ගමන් කිරීම යන ක්‍රියාකාරකම තුලින් උද්දීපනය වන්නේ ...................................... රසයයි.

02 1 මාත්‍රා 2+3 දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාරගත කරන්න.

2 "දිවි කදුරුද ගස එතැන තිබෙන්නේ, සත් වියනක් දිග මොහොල කපන්නේ" යන කවි පද දෙක මාත්‍රා 4 තාලරූපයට ප්‍රස්ථාර කරන්න.

3 කුදංත ගත දොම් වට්ටමට අයත් පළමුවන අඩව්ව අදාල තාල රූපයට ප්‍රස්ථාර කරන්න

03 පහත සඳහන් මාතෘකාවලින් 03ක් පිළිබද කෙටි සටහන් ලියන්න

1 ටීකා සීපද

2 වජිරා චිත්‍රසේන මහත්මිය

3 සතර බීජාක්ෂර

4 ගුරු හාමි

5 කප් සිටුවීම

04 දේශීය ශාන්ති කර්මවල පුරාවෘත කථා මගින් සමාජයට කිසියම් උපදේශාත්මක පණිවිඩයක් ලබා දෙයි.

1 ප්‍රධාන ශාන්ති කර්ම තුනෙහි චාරිත්‍ර විධි 2 බැගින් නම් කරන්න.

2 පහතරට දෙවොල් මඩු ශාන්ති කර්මයේ එන පුරාවෘත්ත කථාව මගින් සමාජයට ලබා දෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න

3 කොහොඹ කංකාරියේ එන සැරසිලි හා රංග භාණ්ඩ පිළිබඳ විග්‍රහයක් කරන්න.

05 1 දේශීය ජන නාටක 02ක් නම් කර පැවැත්වීමේ අරමුණු 3 බැගින් වෙන් වශයෙන් ලියා දක්වන්න.

2 එම නාටකවලට අදාල එක් කවිය බැගින් සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

3 රඟ මඩල සකස් කිරීමේ දී යොදා ගන්නා අමුද්‍රව්‍ය හා රංග උපකරණ නම් කර එහි ඇති වෙනස් කම් හඳුන්වා දෙන්න.

06 1 අද්‍යතන නර්තන නිර්මාණයන් හි ප්‍රාසංගික බව මතු කර දැක්වීමට යොදා ගෙන ඇති තාක්ෂණික ශිල්ප ක්‍රම මොනවාද?

2 තරඟකාරිත්වය ළමා මනසට බලපාන අයුරු රූපවාහිනී නර්තන වැඩ සටහන් ඇසුරින් විමසන්න

3 චිත්‍ර කලාව නර්තන කලාවේ ප්‍රසාංගික බව මතු කර දැක්වීමට බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.